පුවත් වාර්තා කිරීමේදී විශ්වසනීය මූලාශ්‍ර භාවිතා කිරීමත්, බහුමූලාශ්‍ර භාවිතා කිරීමත් අත්‍යවශ්‍ය වන්නේ, පුවතේ කරුණුමය නිරවද්‍යභාවයට මූලාශ්‍රයේ නිවැරදි බව වැදගත් වන හෙයිනි.

වවුනියාවේ තරුණියක ඔක්. 18, 2022 දින රාත්‍රියේ වෙඩි තැබීමකින් ඝාතනය වීමේ පුවත, පුවත්පත් කිහිපයක් ඔස්සේ වාර්තා වී ඇති ආකාරය ඉහත පසුතලය තුළ විමසා බැලිය හැක.

ලංකාදීප - "වවුනියාවේ තරුණියක් නාගෙන එද්දී වෙඩි තබා මරා දමලා" (ඇය දිය නෑමට ගොස් පැමිණෙන අතරතුර සැඟවී සිටි වෙඩික්කරු නිවෙස අසලදී වෙඩි තබා පලා ගොස් ඇති බව පොලිසිය උපුටා දක්වමින් සඳහන් කරයි).

අද - "රාත්‍රියේ ශබ්දයක් ඇසී නිවසින් එළියට ආ තරුණියට වෙඩිතබා ඝාතනය කරලා" (රාත්‍රියේ ශබ්දයක් ඇසී නිවසේ දොර විවෘත කර ගෙමිදුලට පැමිණි අවස්ථාවේදී ගේට්ටුව අසල සැඟවී සිටි අයෙකු වෙඩි තබා පලාගිය බව නිවැසියන් පොලිසියට පවසා ඇතැයි සඳහන් කරයි).

දිනමිණ - "වවුනියාවේ තරුණියගේ ඝාතනය තුන්කොන් පෙමක ප්‍රතිඵලයක් දැයි සැක" (පිටුපස දොර විවර කරගෙන නිවෙසින් පිටතට පැමිණි අවස්ථාවේ ඇය වෙඩි ප්‍රහාරයට ලක්ව ඇති බව පොලිසිය උපුටා දක්වමින් සඳහන් කරයි).

ඒ අනුව,

නිරවද්‍ය පුවත කුමක් විය හැකිද?

**අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!